
# මේස රෙද්දක් පෑ ප්‍රාතිහාර්යය





අළුතින් පත්වූ පූජකතුමා සහ ඔහුගේ බිරිඳ පල්ලියේ වැඩ බාරගැනීම පිණිස ඇමරිකාවේ බෲක්ලින් පෙදෙසේ ගම කට ඔක්තෝබර් මාසයේ පැමිණියෝය. එහෙත් පල්ලියේ පෙනුම ඔවුන්ගේ බලාපොරොත්තු සුන් කළේය. ඊට හේතුව එම පල්ලිය ඉතා අබලන් තත්වයේ පැවතීමයි.

එහෙත් එයින් අධෛර්යයට පත් නොවූ ඔව්හු නත්තලට කලින් පල්ලිය



ප්‍රතිසංස්කරණය කරන්නට තදින් සිතට ගත්තෝය. පල්ලියේ විශේෂ බංකු අළුත් වැඩියා කළෝය. අබලන්ව තිබූ බිත්ති අළුතින් කපරාරු කළෝය. දැන් එම පල්ලිය ඉතාම අළුත් මුහුණුවරක් ගත්තේය.

දෙසැම්බර් 16 වන දින වැඩ නිමාවිය. දෙසැම්බර් 25 නත්තල සැමරීම ඔවුන් පුල පුලා සිටි අවස්ථාවයි. එහෙත් අභාග්‍යයකට මෙන් 19 වන දින තද වර්ෂාවක් සහ කුණාටුවක් ඇතිවිය. දෙසැම්බර් 21 වන දින පල්ලියට ගිය පූජකවරයා දුටුවේ ඉතා දුක්මුසු දර්ශනයකි. වර්ෂාව සහ සුළඟේ පීඩනයට වහලේ ඇති වූ සිදුරකින් වතුර ගලා ඉන් අල්තාරය ඉදිරිපිට බිත්තියේ බදාම ගිලිහී බිමට වැටී තිබුණේය.

වික්ෂිප්ත වූ සිතින් පූජකතුමා මේ සියල්ල තම බිරිඳට පැවසීමට සිතා නිවස කරා පා නැගීය. ඒ අතර මග පැරණි භාණ්ඩ හා පරණ ලට පට විකුණන වෙළඳ සලකි. මොහොතකට එහි රැඳුණු ඔහු දුටුවේ අතින් නිම කළ, ඉතා ශෝභමාන, ඇත්දත් පැහැති මේස රෙද්දකි. එය විචිත්‍ර ලෙස එම්බ්‍රොයිඩර් ක්‍රමයට වියා තිබිණ. පල්ලියේ බදාම ගිලිහීගිය තැන හිඩැස් ඇති බිත්ති ප්‍රමාණයට මෙම රෙද්ද කදිමට සරිලන බව පියතුමාට හැඟී ගියේ ය.

එම මේස රෙද්ද මිළදී ගත් එතුමා වහාම පල්ලිය වෙත ගියේය. ඒ වන විට ශීත කාලය හේතුවෙන් හිම වැටෙමින් තිබිණ. ගමනක් යමින් සිටි මහළු කාන්තාවක් බසයට නැග ගන්නට බැරිවීම නිසා ආවරණය සඳහා පල්ලියට ඇතුළු වූවාය. හිම වැටී අවසාන වනතුරු සීතලෙන් මිදී උණුසුම් පිට පල්ලියේ වාඩිවී ඉන්නට යයි පූජකවරයා ඇයට කීවේය. කාන්තාව ඒ කීම පිළිගත්තීය. ඉක්බිති ඔහු ලහි ලහියේ ඉනිමගක් ගෙනැවිත් සීරුවෙන් එය බිත්තියට තබා උඩට නැග, අර මේස රෙද්දෙන් බදාම ගැලවුණු තැන ආවරණය කළේය. ඇත්තටම එම ලස්සන මේස රෙද්ද දර්ශණීය චිත්‍රයක ආකාරයෙන් එතැනට කදිමට ගැලපුණේ ය.

මේ දෙස බලා සිටි මහළු කාන්තාව පූජකවරයාගෙන් මෙසේ ඇසුවා ය.

"සමාවෙන්න පූජකතුමනි! ඒ මේස රෙද්ද ඔබට ලැබුණේ කොහෙන්ද ?"

පූජකවරයා එය තමාට ලැබුණු ආකාරය විස්තර කළ පසු ගැහැණිය මෙසේ පැවසුවා ය.

"කරුණාකර බලන්න ඔය මේසෙ රෙද්දෙ එක කොණක E B G අකුරු තුන මහල තිබෙනවාද කියලා."

පූජකවරයා රෙද්ද පිරික්සීය. සැබැවකි. ඇය කිව් පරිදිම එම අකුරු තුන එහි මසා තිබුණි. එම අකුරු ඇගේ නමේ මුල් අකුරු බවත්, ඊට අවුරුදු 35 කට පෙර එම එම මේස රෙද්ද ඇය ගෙතූ බවත් කාන්තාව කියා සිටියාය. සිය ඇස් අදහාගන්නට බැරිතරම් විෂ්මයට පත්ව සිටි ඇය ඉන්පසු



පූජකවරයාට මෙසේ විස්තර කළා ය.

"දෙවන ලෝක සංග්‍රාමයට පෙර මමත් මගේ ආදරණීය සැමියාත් ජීවත්වුණේ ඔස්ට්‍රියාවේ. අපට සෑහෙන මුදල් තිබුණා. ජර්මන් නාට්සිකාරයින් දවසක් ඇවිත් අපට අඩන්තේට්ටම් කළා. මට පැන යන්නට සැළැස්වූ මගේ ස්වාමිපුරුෂයා ඊළඟ සතියේ කෙසේ හෝ නාට්සින්ගෙන් ගැලවී මා හමුවන බව කීවා. නමුත් අද වනතුරු එයා ආගිය අතක් නැහැ. සමහර විට ඔහු හිරබාරයට ගන්න ඇති. මරා දමන්නත් ඉඩ තියනවා."

මේ කතාව ඉතා සාවධානව අසා සිටි පූජකතුමා එම මේස රෙද්ද ඇයට තෑගි දීමට සූදානම් විය. එහෙත් එය ප්‍රතික්ෂෙප කළ කාන්තාව එම රෙද්ද වඩාත් ඔබින්නේ පල්ලියට බව කීවාය. තමා බෲක්ලින් නගරයේ ස්ටේටන් දූපතේ ඉන්නා බවත්, එහි නිවෙස්වල සුළු සුළු වැඩ නරඳී දිවි රැකගන්නා බවත් කීවාය. වර්ෂාව අවසාන වූ පසු පූජකතුමා ඇය ඇයගේ නිවසටම ගොස් ඇරලුවේය.

නත්තල් දින උදාවූ පසු එදින පල්ලියේ උත්සවය ඉතා මනස්කාන්ත අන්දමින් සිදුවිය. උත්සවයෙන් පසු පිරිස පූජකතුමාගෙන් ආශීර්වාද ලබා ක්‍රමයෙන් විසිර ගියෝය.

එහෙත් නිතර පල්ලියට යන එන එක්තරා මහළු මිනිසෙක් නතර වී අල්තාරයට උඩින් එල්ලා ඇති මේස රෙද්ද දෙස බලාගෙන සිටියේය. එසේ බලා සිටින්නේ ඇයි දැයි පූජකතුමා ඔහුගෙන් ප්‍රශ්න කළ විට මහළු තැනැත්තා හැඬූ කඳුලෙන් මෙසේ උත්තර දුන්නේය.

"ගරු පියතුමනි ඔබට මෙය ලැබුණේ කොහොමද? කොහෙන්ද? මේ වැනිම මේස රෙද්දක් යුද්ධයට පෙර මගේ ආදරණීය බිරිඳ ගෙත්තම් කළා. එකම විදියේ සර්වසම මේස රෙදි දෙකක් ලෝකෙ තියෙන්න පුළුවන්දැයි හිතමින් මම පුදුම වුණා."

"මම ඔබට හැම දේම විස්තර කර දෙන්නම් ඔබ මා සමග මගේ කාර් එකෙන් පොඩි ගමනක් යන්න එනවාද?" පියතුමා ඇසීය. මහල්ලා ද එකඟ විය. පූජකතුමා ස්ටේටන් දූපතේ ඉහතකී කාන්තාවගේ නිවස ඉදිරිපිට රථය නවතා බැස ගොස් දොරට තට්ටු කළේ ය. නිවසින් එළියට පැමිණි ඇයට පූජකතුමා සියළු පුවත් දැන්වූයේ ය.

අවුරුදු 35 කට වැඩි කාලයකට පසු ආදරණීය සැමියෙක් සහ යහපත් බිරිඳක් එකතු වූහ. පූජකතුමා ඔවුන්ට දුන්නේ ඉතාම වටිනා නත්තල් ත්‍යාගයකි.


"දෙවියන් වහන්සේ ක්‍රියාකරන්නේ ඉතාම ගුප්ත අන්දමට" යයි කියාගෙන මහත් සැනසීමට පත් පූජකවරයා ඉතා ප්‍රීතියෙන් නැවත පල්ලිය කරා ගියේ ය.

*මෙම සත්‍ය කතාව ගරු **Rob Reid** නම් පූජකතුමා **Rosary Letters** නම් සඟරාවට සපයන ලද ලිපියක් ඇසුරෙනි.*

♦ ***මහාචාර්ය සම්පත් ඇන්සන් ප්‍රනාන්දු***
**Essex UK**

## සාදර සිහිකිරීමයි!

## රන්ජිත් පලන්සූරිය මහතා



**රන්ජිත් පලන්සූරිය මහතා වියෝවී ගිය ජූලි මස 26 වන දිනට වසරක් සම්පූර්ණ විය. ඒ වෙනුවෙන් නිවසේ පැවැත්වුණු සුමධුර ධර්ම දේශනාවකි. පසුදින සංඝයා වහන්සේ විෂයෙහි දක්ෂිණාවකි.**

**ඒ පින්බෙලෙන් ඔබට සසර ගමනේ දී කිසිවිට අකල් මරණයක් නොවී, යළිත් අපට මුණගැසී, අවසන නිවන් සුව අත්වේවායි පතමු!**

***අදරැති නාලිනී, දියණියන්, පුතා ඇතුළු පවුලේ ඥාතීන් සහ හිතවතුන් සැම***
**Queensbury, London**



# උතුරු වසන්තය, නැගෙණහිර උදානය සහ දකුණේ නියඟය

**මේ**ක උතුරු වසන්තයෙන්ම පටන්ගනිමු. උතුරු වසන්තය කියන යෙදුම මම මුලින්ම දැක්කෙ මාස තුනකට පෙර ලංකාවට ගිය වෙලාවෙ. ලංකාවෙ පත්තරවලයි රූපවාහිනී නාලිකාවලයි, අපේ ආත්තම්මගෙ වචන වලින් කියනවා නම්, **යමරෙට** කරපු රජයේ ප්‍රචාරක වැඩසටහන් වලින්. එතකොට යුද්දෙ ඉවර වුණා විතරයි. විනාඩි පහෙන් පහට වයිවාරණ නැටුම් සිංදු. සංගීත කණ්ඩායම් යුද්දෙන් පිපිරිච්ච පාළම් උඩ ගිටාර් ගගහ සිංදු කියනවා. විද්වත් මණ්ඩල ඇවිත් සාකච්ඡා. මේ සේරම කියන්නෙ උතුරෙයි, නැගෙණහිරෙයි ඉන්න ජනතාව සේරම දැන් අපි එක්කයි. අපි මේ අය සුබිත මුදිත කරන්න ඕන. ඒ අතරෙ පෙන්නනවා දකුණෙයි කොළඹයි ඇතුළු සිංහල පළාත්වල උතුරට නැගමන් යන්න පුදුම හදිස්සියකින් ලොරිවල කෑම බීම, හාල් තුනපහ ලෑස්තිකරනවා. හාමුදුරුවරු පවා පන්සල්වල උතුරට ගෙනියන්න බඩු එකතුකරනවා. ලොරිවලට පටවනවා. වැඩ කෝටියයි. තව කස්ටියක් කොටි විනාසකරලා දුවන්නෙ නැතුව පැත්තකට දාලා තිබ්බ්ච යාල දේවි කෝච්චියෙ පෙට්ටි යතුගාලා හදනවා. මළකඩ කාපු ඇණවලට තිරිංගවලට තෙල්දානවා. මොකටද? හෙට අනිද්දා උතුරට කෝච්චියෙන් නැගමන් යන්න. අවුරුදු දෙක තුනකට ඉස්සෙල්ලා කොටි හැටියට ඉඳලා දැන් ආණ්ඩුවට අරගෙන ඉන්න කරුණයි පිල්ලෙයානුයි දෙන්නත් ඒ අතරට ඇවිල්ලා හිනාවෙනවා. මැති ඇමතිවරුන්ට අතට අත දෙනවා. කිරිබත් කනවා. තේ වතුර බොනවා.

ඒ අතරෙ ජනාධිපතිතුමාගෙන්, අගමැතිතුමාගෙන් උතුරු වසන්තයට සුබ පැතුම් පණිවුඩ. මැති ඇමතිවරුන්ගෙ කට කන ළඟට ඉරෙනකම් මූණෙ හිනා එක්ක පින්තූර. ඒ අතරෙම අනාථ කඳවුරුවල ඉන්න ලක්ෂ ගණනක් උතුරෙන් පැනලා ආපු දෙමළ ජනතාව පෙන්නනවා. ඒ අයගෙ ලෙඩට දුකට හමුදාවෙන් බලනවා. කෑමබීම දෙනවා. වයසක අය දෑතින් උස්සගෙන ගිහින් පුටුවල තියනවා. පොඩි දරුවො හුරතල් කරනවා, වඩාගන්නවා.

මේ සේරම හොඳ දේවල්. ඒකෙ ආයිත් දෙකක් නෑ. මං මේවා නොකර ඉන්නය කියනවා නොවෙයි. මෙයින් එහාට හිතලා බැලිය යුතු දෙයක් තියනවා. අද ඊයෙ නෙවෙයි ඉතිහාසෙ කවර කාලෙකවත් සිංහළ මිනිස්සු එහෙම දුර හිතලා බලලා නැහැ.

කොටි සංවිධානෙ යටතෙ කොටුවෙලා හිටපු ලක්ෂ ගණනක් කොටින්ගෙන් බේරිලා බෝට්ටුවලින් හමුදාව ඉන්න පැත්තට පැනලා ආවා, අපි දැක්කා. පැනලා යන කොට කොටි ඒ තමන්ගෙම මිනිස්සුන්ට වෙඩි තිබ්බා, ඒ මිනිස්සු ඇවිත් අඬ අඬ කිව්වා, කොටි හිරිහැර කරපු හැටි. හමුදාව බේරගත්තු එක ගැන ප්‍රශංසා කළා. දැන් මෙන්න මෙතන ඉඳලයි පරිස්සමෙන් මේ සිද්ධවෙන දේ ගැන බලන්න ඕන.

ආණ්ඩුව සහ අපේ බහුතර සිංහළ ජනතාව හිතන විදියට මේ දෙමළ මිනිස්සු සේරම දැන් අපි එක්කද? ඇත්තටම මුන්ට කොටි එපාවෙලාද? හරි චිත්‍රය මොකක්ද?

මේ ළඟදි අනාථ කඳවුරකට ගිය රජයේ නිලධාරියෙක් තමන් දුටු දේ අපිට කිව්වා. "මේ කඳවුරුවල ඉන්න බහුතරය තවම කොටින්ට පක්ෂයි. කඳවුරේදි කාලා පිඟාන හෝදන්නෙවත් නෑ. එහෙම්ම දාලා යනවා. ඒවා හමුදා නිලධාරි හෝදන්න ඕන. මුන්ගෙ මූණෙ කිසි හිනාවක් නෑ. සරණාගතයො තමන් ඉන්න තැන අතුපතුගාන්නෙ වත් නැහැ. හමුදාව ඒවත් කරන්න ඕන. හරියට නිකං "උඹලා අපිව ගෙනාව නම් දැන් ඉතින් අපේ හැමදේම උඹලම කරපල්ලා" කියන ගානට."

මේ ළඟදි ජනාධිපතිතුමාගෙ පුතෙක් වව්නියාව පැත්තෙ අනාථ කඳවුරක් බලන්න ගිය වෙලාවෙ ඒ ඉතා අහිංසකය කියන ජනයා, ජනපති පුත්‍රයට කෑගහලා, බැනලා, අතේ තිබුණු ඒවා වීසිකරලා ගහපු බවක් ලංකාවෙ මාධ්‍යයෙ පළවෙලා තිබුණා. ඒ කඳවුරුවල ජනකායෙන් බහුතරය තවම ඊළම පතන, කොටින්ට පක්ෂ අය. සත්‍යය ඒකයි. ඒත් මේවා නොදැක්ක වගේ අපේ ආණ්ඩුවත්, මෝඩ සිංහළ ජනතාවත්, මැති ඇමතිවරු කොහොමත් මෝඩ නේ, උතුරට නැගෙණහිරට පැනලා දෙන්න යනවා. සංවර්ධන වැඩ කළයුතු තමයි. ඒත් පිස්සුවෙන් වගේ රටේ අනික් සේරම පැති අමතක කරලා තියන හැම දේම උතුරට ගිහිං හලන එක නෙවෙයි. උතුරෙ මිනිස්සුන්ට මේ කරන දේවල වටිනාකමක් තේරෙනවද? මේච්චර රජය මැරීගෙන කරද්දි ඒවයෙ හොඳක් වචනයකින් වත් කියනවද? නෑ.

හොඳම උදාහරණය තමයි උතුරෙයි නැගෙණහිරයි ඊයෙ තිබුණු පළාත්පාලන ඡන්දෙ ප්‍රථිපල. නැගෙණහිර පළාතෙ ආසන 11 න් රජයට ලැබුණෙ 2 යි. කොටින්ගෙ පක්ෂය හැටියට දැන් පෙනී සිටින පරණ **තමිල් අරසු කච්චි** හෙවත් **දෙමළ රාජ්‍ය පක්ෂයට** ආසන 5 ක් ලැබුණා. යාපනේ ආසන 23 න් රජයට 13 ක් ලැබුණත් **අරසු කච්චියට** එතනත් 8 ක් ලැබුණා. රජය හිතුවා කොටි එපා වෙච්ච දෙමළ මිනිස්සු වැල නොකැඩී ඇවිත් රජයට කතිරෙ ගහවි කියලා. උන් තවමත් පක්ෂ කොටින්ට. මෙයින් පේනවා උතුරයි නැගෙණහිරයි යන අත. අවුරුදු 30 ක් කොටි රජකරපු උතුර නැගෙණහිර මාස 3 කින් සේරම ජනතාව, ආණ්ඩුව කන්න දුන්නයි කියලා, දුවගෙන ඇවිල්ලා මූණ ඉඹීවිය කියලා හිතන්න එපා. රජය හිතා ගෙන ඉන්නෙ එහෙමයි.

අනේ මොණරාගල මිනිස්සු දුක් විදිනවලු නියඟෙ හන්දා වතුර නැතුව. රජයෙ කිසි කෙනෙක් එහේ ගිහිං නෑ. බලන්න කෙනෙක් නෑ. කවද හරි දවසක උතුරු වසන්තෙ ඉවරවෙන කල් ඉවසගෙන ඉන්න කියල ඒ මිනිස්සුන්ට කියමු.

♦ **වෙලේගෙදර රාළ London**